[Limited Sharing]

තහනම් පිරමීඩ යෝජනා ක්‍රම සහ නීතිමය පසුබිම



මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA
TOWARDS PROSPERITY

[Limited Sharing]

අන්තර්ගතය

- පිරමීඩ යෝජනා ක්‍රමයක් යනු කුමක්ද?
- පිරමීඩ යෝජනා ක්‍රමයක් ජාල අලෙවිකරණයෙන් වෙනස් වන්නේ කෙසේද?
- නීතිමය පසුබිම
- ව්‍යුහය
- පිරමීඩ යෝජනා ක්‍රමයක් ප්‍රවර්ධනය කරන ආකාරය
- පිරමීඩ යෝජනා ක්‍රමයක පුද්ගලයින් ආකර්ශනය කරන ක්‍රම
- ප්‍රතිලාභ ලබා දෙන ආකාරය
- පිරමීඩයක් ලෙස නොපෙන්වීමට ප්‍රවර්ධකයින් යොදා ගන්නා ක්‍රම
- ප්‍රතිලාභ ලබා දෙන ආකාරය
- පිරමීඩ යෝජනා ක්‍රමයක් බව නොපෙන්වීමට යොදා ගන්නා උපක්‍රම
- පිරමීඩ යෝජනා ක්‍රම වල ආයෝජනය කිරීමෙන් ඇතිවන අහිසි ප්‍රථිපල
- නෛතික ප්‍රතිපාදන
- පිරමීඩ යෝජනා ක්‍රම වැලැක්වීමේ යුතුකම සහ වගකීම
- වර්තමාන තත්වය
- දැනුම් දිය හැකි ආකාරය

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA
TOWARDS PROSPERITY

පිරමීඩ යෝජනා ක්‍රමයක් යනු කුමක්ද?

1988 අංක 30 දරණ බැංකු පනතේ 83-ඇ වගන්තිය අනුව යම් ආයතනයක සාමාජිකයින්ට මුදලින් හෝ මූල්‍යමය අගයකින් ගෙවීමක් කිරීමට නැතහොත් දායක වීමට සිදුවන්නා වූත් එමඟින් සහභාගී වන්නන් උපයනු ලබන ප්‍රතිලාභ :

1. යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය වැඩිවීම මත හෝ,
2. යෝජනා ක්‍රමයේ සාමාජිකයින් විසින් ගෙවනු ලබන මුදල් ප්‍රමාණය වැඩිවීම මත හෝ,

තීරණය වන්නාවූ ක්‍රමයක් ක්‍රියාත්මක වන්නේ නම් එය නීතිවිරෝධී පිරමීඩාකාර යෝජනා ක්‍රමයක් ලෙස සැලකේ

පිරමීඩ යෝජනා ක්‍රමයක් ජාල අලෙවිකරණයෙන් වෙනස් වන්නේ කෙසේද?

ජාල අලෙවිකරණය	පිරමීඩ යෝජනා ක්‍රමය
01.නිෂ්පාදකයා විසින් භාණ්ඩ විකුණා මුදල් ලබා ගැනීමට බලාපොරොත්තු වීමක් සිදු වන බැවින් නිෂ්පාදිත භාණ්ඩයේ ගුණාත්මකභාවයක් ඇත.	01. ගුණාත්මකභාවය පිළිබඳ සෑහීමකට පත්විය නොහැක.
02. අවසාන පාරිභෝගිකයින්ට භාන්ඩ හා සේවා විකිණීමෙන් ආදායම් ඉපයීම අරමුණු කරයි.	02. එසේ නොවන අතර නව බඳවා ගැනීම් වැඩිකරමින් කොමිස් ලබා ගැනීම් අරමුණු කරයි
03. වෙළඳපොලෙහි දැකිය හැකි භාණ්ඩ වේ.	03. වෙළඳපොලෙහි පහසුවෙන් දැකිය හැකි භාණ්ඩ නොවේ.
04. පාරිභෝගිකයා නිෂ්පාදනය පිළිබඳ සෑහීමකට පත් නොවන්නේනම් ඒ පිළිබඳව පැමිණිලි ඉදිරිපත් කල හැක.	04. භාණ්ඩය පිළිබඳව පැමිණිලි කිරීමට පහසුකම් සපයා නොමැත
05. පාරිභෝගිකයා හා නිෂ්පාදකයා අතර නිෂ්පාදන බෙදාහැරීමේ ක්‍රියාවලියට අතරමැදියෙකු ලෙස සම්බන්ධ වී කොමිස් මුදලක් ලබා ගත හැක.	05. යම් පුද්ගලයෙකු වෙනත් පුද්ගලයෙකුට භාණ්ඩය විකිණීමට පෙර එම භාණ්ඩය මිලදී ගත යුතු වීම.

නීතිමය පසුබිම

1988 අංක 30 දරන බැංකු පනතේ 83(ඇ) වගන්තිය ප්‍රකාරව,

වරද/අපරාධය:

පිරමිඩ යෝජනා ක්‍රමයක් - ආරම්භ කිරීම, අර්පණය කිරීම, ප්‍රවර්ධනය කිරීම, ප්‍රචාරය කිරීම, පැවැත්වීම, මුදල් සැපයීම, කළමනාකරණය කිරීම, හෝ විධාන කිරීම.

දඬුවම්:

- වසර තුනක සිර දඬුවමක් හෝ; රුපියල් දස ලක්ෂයක් දක්වා දඩයක් හෝ; සිර දඬුවම හා දඩය යන දෙකම.
- වෙනත් කෙනෙකුට පාඩුවක්/කරදරයක් වන බව දැන දැනම කළහොත් වසර තුනත්, පහත් අතර බරපතළ වැඩ සහිත සිර දඬුවමක් මෙන්ම රුපියල් ලක්ෂ විස්සක හෝ සහභාගිකරුවන්ගෙන් ලද මුදල මෙන් දෙගුණයක් යන දෙකෙන් වැඩි ප්‍රමාණයට සමාන දඩයක්

ව්‍යුහය





[Limited Sharing]

පිරමීඩාකාර උගුල





ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA
TOWARDS PROSPERITY

පිරමීඩ යෝජනා ක්‍රම ප්‍රවර්ධනය කරන ආකාරය

- මහජනතාව ඒකරාශී වන අවස්ථා එනම් ක්‍රීඩා, ආගමික උත්සව, සංගීත සංදර්ශන, ප්‍රජා සේවාවන්, තරුණ ප්‍රජාවට පවත්වනු ලබන වෘත්තීය පුහුණු වැඩමුළු සඳහා සම්පත් දායකත්වය ලබා දීමට ඉදිරිපත් වීම.
- Tik Tok, Facebook වැනි සාමාජ මාධ්‍ය ජාලා ඔස්සේ ප්‍රචාරණ කටයුතු සිදු කිරීම.
- නෑදෑයින්, මිතුරන් වැනි සමීපතයින් යෝජනා ක්‍රමය සඳහා සහභාගී කර ගැනීම.
- සුඛෝපභෝගී වාහන, නිවාස, ජංගම දුරකථන, ලැප්ටොප් පරිඝණක ආදී පෙන්වමින් ඒවා තමන්සතු කර ගත හැකි බවට පත්වීමේ සිහිනය මහජනතාව තුල ඇති කිරීම.

[Limited Sharing]

පිරමීඩ යෝජනා ක්‍රමයක පුද්ගලයින් ආකර්ශනය කරන ක්‍රම?

පිරමීඩ යෝජනා ක්‍රමයක පුද්ගලයින් ආකර්ශනය කරන ක්‍රම?

[Limited Sharing]

ප්‍රතිලාභ ලබා දෙන ආකාරය?

- දේශීය විදේශීය සංචාර ලබා දීම.
- ඉතා විශාල ප්‍රතිලාභ අඩු කාලයක් තුල ලබා දීම.
- පුද්ගලයින් සම්බන්ධ වන ප්‍රමාණය වැඩි වෙන ආකාරය අනුව ලැබෙන ප්‍රතිලාභ වැඩි වීම.

[Limited Sharing]

පිරමීඩයක් ලෙස නොපෙන්වීමට ප්‍රවර්ධකයින් යොදා ගන්නා උපක්‍රම?

- සමාගමක් ලෙස ලියාපදිංචි කර ඇති බව පැවසීම හා ලියාපදිංචි සහතිකය ප්‍රදර්ශනය කිරීම.
- භාණ්ඩ අලෙවිය පමණක් නොව සේවා සැපයීම්, පැල අලෙවි කිරීම් ආදී, ට්‍රේඩිං කිරීම ආදී විවිධ නම් භාවිතා කිරීම.
- සහතිකයක් හෝ ගිවිසුම්පතක් ලබා දීම හෝ එසේ ලබා දෙන බව පැවසීම.

පිරමීඩ යෝජනා ක්‍රමවල ආයෝජනය කිරීමෙන් ලැබෙන අනිසි ප්‍රතිවිපාක?

පිරමීඩ යෝජනා ක්‍රමවල ආයෝජනය කිරීමෙන් ලැබෙන අනිසි ප්‍රතිවිපාක?

- පිරමිඩ ජාවාරම් සඳහා යෙදවීමට මුදල් සොයාගැනීම
  - ඉතිරි කිරීම් වලින්
  - වත්කමක් විකිණීමෙන්
  - මුදල් ඉල්ලාගැනීම (ප්‍රේෂණ වලින්)
  - අතමාරුවක්
  - ණය මුදලක් මඟින්
- රැකියා අත් හැරීම -
- මානව හා පවුල් සබඳතා බිඳ වැටීම
- යෝජනා ක්‍රමයට හඳුන්වා දුන් තැනැත්තා සමග ඇතිවන ආරවුල්
- ප්‍රචණ්ඩත්වයට, වෙනත් අපරාධවලට, බංකොලොත්භාවයට, දික්කසාදයට, සිය දිවි නසා ගැනීමට යොමුවීම

සිද්ධි අධ්‍යයනය

1990 වර්ෂයේ, ඇල්බේනියාව

[Limited Sharing]

සිද්ධි අධ්‍යයනය

ඇල්බේනියානු අත්දැකීම්

- පිරමිඩ වල යොදවා තිබූ මුදල් ද.ජා.නි. යෙන් අඩකට වැඩිය
- සාමාජිකයින් ජනගහනයෙන් 2/3 ක් පමණ විය

  - පිරමීඩ ක්‍රමය කඩා වැටුණි
  - ජනයා වීදි බැසීය
  - රජයට ඉල්ලා අස්වන ලෙස බල කෙරුණි
  - භාණ්ඩ සහ සේවාවල මිල අධික ලෙස ඉහළ ගියේය
  - සිවිල් කෝලාහාල හේතුවෙන් දේපල පාඩුව ඩොලර් මිලියන 50 කි.
  - සිදුවූ මරණ ගණන 2000 කට වැඩිය
  - ආර්ථිකය කඩා වැටුණි

අහිතකර ප්‍රතිවිපාක

මූල්‍ය සුනාමියක් !

❖ පිරමිඩ ජාවාරම් සඳහා යෙදවීමට මුදල් සොයාගැනීම



පිරමීඩ ව්‍යාපාර නිසා සමස්ථ මූල්‍ය පද්ධතියට වන බලපෑම

පිරමීඩ ක්‍රමයන්ගේ අයුතු ක්‍රියාකාරිත්වය

සුපරීක්ෂණයක් හෝ නියාමනයක් නොමැතිකම

↓

ඉහළ ව්‍යාපාරික අවදානම

↓

මහජනයාගේ මුදල් අහිමි වීම

↓

මූල්‍ය පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය බිඳවැටීම

↓

සමස්ථ මූල්‍ය පද්ධතිය අස්ථාවර වීම

අහිතකර ප්‍රතිවිපාක

- රැකියා අත් හැරීම
- මානව හා පවුල් සබඳතා බිඳ වැටීම
- යෝජනා ක්‍රමයට හඳුන්වා දුන් තැනැත්තා සමග ඇතිවන ආරවුල්
- ප්‍රචණ්ඩත්වයට, වෙනත් අපරාධවලට, දික්කසාදයට, සිය දිවි නසා ගැනීමට යොමුවීම
- බංකොලොත්භාවය

නෛතික ප්‍රතිපාදන

- (3) වන උප වගන්තිය යටතේ පවත්වනු ලබන විමර්ශනයක් අතරතුරදී ලබා ගත් යම් තොරතුරු, ලේඛණ, පොත්පත්, වාර්තා හෝ පරිගණක ආධාරයෙන් ලබාගත් අනුපත් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නීතිය ක්‍රියාත්මක කිරීමෙ බලධරයන් වෙත ලබා දිය යුතු අතර (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝණය කිරීම සඳහා යම් තැනැත්තෙකුට එරෙහිව නඩු පැවරීමේදී එම බලධරයන්ට සහාය ලබා දිය යුතුය.

- ආණ්ඩුකුම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවනු ලැබූ කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ මහාධිකරණය වෙත පොලිස් පරීක්ෂකයෙකුගේ නිලයට වඩා ඉහළ නිලයක පොලිස් නිලධරයෙකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මත සහ (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝණය කිරීම සඳහා යම් තැනැත්තෙකුට එරෙහිව බැලූබැල්මට පෙනෙන නඩුවක් ඇති බවට එම අධිකරණය සෑහීමට පත් වීමෙන් පසු, (1) වන උපවගන්තියේ නිශ්චිතව දැක්වෙන යම් ක්‍රියාවක් සිදු කිරීම වරදකරුට තහනම් කරමින් ඔහුට එරෙහිව ඒකපාර්ශවික ආඥාවක් එම අධිකරණය විසින් නිකුත් කරනු ලැබිය යුතුය.

[Limited Sharing]

නෛතික ප්‍රතිපාදන

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA
TOWARDS PROSPERITY

දඬුවම්

1988 අංක 30 දරණ බැංකු පනත - 83 C වගන්තිය

වරද/අපරාධය:

පිරමිඩ යෝජනා ක්‍රමයක් - ආරම්භ කිරීම, අර්පණය කිරීම, ප්‍රවර්ධනය කිරීම, ප්‍රචාරය කිරීම, පැවැත්වීම, මුදල් සැපයීම, කළමනාකරණය කිරීම, හෝ විධාන කිරීම.

දඬුවම්:

- වසර තුනක සිර දඬුවමක් හෝ; රුපියල් දස ලක්ෂයක් දක්වා දඩයක් හෝ; සිර දඬුවම හා දඩය යන දෙකම.
- වෙනත් කෙනෙකුට පාඩුවක්/කරදරයක් වන බව දැන දැනම කළහොත් වසර තුනත්, පහත් අතර බරපතළ වැඩ සහිත සිර දඬුවමක් මෙන්ම රුපියල් ලක්ෂ විස්සක හෝ සහභාගිකරුවන්ගෙන් ලද මුදල මෙන් දෙගුණයක් යන දෙකෙන් වැඩි ප්‍රමාණයට සමාන දඩයක්

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA
TOWARDS PROSPERITY

පිරමීඩාකාර යෝජනා ක්‍රම වැලැක්වීමේ වගකීම සහ යුතුකම්?

- නීතිය ක්‍රියාත්මක කරන ආයතන වල දායකත්වය -
- තම ප්‍රදේශයේ ව්‍යාප්ත වන මෙම ආකාරයේ යෝජනා ක්‍රම පිළිබඳව විමසිලිමත් වීම.
- විමර්ශන සහ වැටලීම්
- යථා පරිදි අධිකරණයට කරුණු වාර්තා කිරීම හා වැඩිදුර විමර්ශනය සඳහා අවසර ලබා ගැනීම
- අදාල නියාමන ආයතනයන්ට, මහ බැංකුවට හෝ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය අපරාධ පරීක්ෂණ අංශය වෙත මූලික විමර්ශන තොරතුරු ලබාදීම.
- නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් සඳහා යොමුකිරීම.
- ග්‍රාමීය මට්ටමින් මහජනතාව දැනුවත් කිරීම

පිරමීඩාකාර යෝජනා ක්‍රම වැලැක්වීමේ වගකීම සහ යුතුකම්?

ශ්‍රී ලංකා මහ බැංකුවේ දායකත්වය -

- ප්‍රධාන වශයෙන් පිරමිඩ ජාවාරම් වලට සම්බන්ද නොවී සිටීමට මහජනතාව දැනුවත් කිරීම
- නීතිපති දෙපාර්තමේන්තුව සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතන සමග සම්බන්ධ වෙමින් පිරමීඩාකාර යෝජනා ක්‍රමවලට එරෙහිව කටයුතු කිරීම.
- පොලිසිය විසින් කරනු ලබන අත් අඩංගුවට ගැනීම්වලදී පැමිණිල්ල වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටීම
- පිරමීඩාකාර යෝජනා ක්‍රම ඇතුළු මූල්‍ය අපරාධ පිළිබඳව පර්යේෂණ සිදු කිරීම සහ නීතිමය අවශ්‍යතාවන් සළකා බැලීම

මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්



මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්



[Limited Sharing]

මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්



ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA
TOWARDS PROSPERITY

මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්



පිරමීඩාකාර යෝජනා ක්‍රම වැලැක්වීමේ වගකීම සහ යුතුකම්?

මහ ජනතාවගේ වගකීම සහ දායකත්වය -

- ඔබ දැනුවත් වන්න
- පිරමීඩ ජාවාරම් වලට හසු නොවන්න
- අන්අය දැනුවත් කරන්න
- ජාවාරම් වලට තනිව සහ එක්ව එරෙහිවන්න
- නීතිය ක්‍රියාත්මක කිරීමේ අංශ දැනුවත් කරන්න

[Limited Sharing]

වර්තමාන තත්වය

මාධ්‍ය නිවේදනය

[illegible]

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

නිකුත් කළේ	මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව
දිනය	2025.03.21

තහනම් පිරමිඩ යෝජනා ක්‍රම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම

1988 අංක 30 දරන බැංකු පනතේ 83(ඇ) වගන්තිය උල්ලංඝනය කරමින්

Pro Care (Pvt) Ltd., Shade of Procare (Pvt) Ltd

තහනම් පිරමිඩ යෝජනා ක්‍රම පවත්වා ඇති බවට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිර්ණය කර ඇත.

තවද, 1988 අංක 30 දරන බැංකු පනතේ 83(ඇ) වගන්තියට අනුව පහත සඳහන් ආයතන/ඇප් තහනම් පිරමිඩ යෝජනා ක්‍රම පවත්වා ඇති බවට නිර්ණය කර ඇත.

1. Tiens Lanka Health Care (Pvt) Ltd
2. Best Life International (Pvt) Ltd
3. Mark – Wo International (Pvt) Ltd
4. V M L International (Pvt) Ltd
5. [redacted]
6. Fast3Cycle International (Pvt) Ltd
7. Sport Chain app, Sport Chain zs society Sri Lanka
8. OnmaxDT
9. MTFE App, MTFE SL Group, MTFE Success Lanka, MTFE DSCC Group
10. Fastwin (Pvt) Ltd
11. Fruugo Oline App/ Fruugo Oline (Pvt) Ltd
12. Ride to Three Freedom (Pvt) Ltd
13. Qnet
14. Era Miracle (Pvt) Ltd and Genesis Business School
15. Ledger Block
16. Isimaga International (Pvt) Ltd
17. Beecoin App and Sunbird Foundation
18. Windex Trading
19. The Enrich Life (Pvt) Ltd
20. Smart Win Entrepreneur (Pvt) Ltd
21. Net Fore International (Pvt) Ltd/ Netrrix

---

[1] ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු පනතේ 83(ඇ) වගන්තිය යටතේ නිශ්චය කොට ඇති සමාගමක නාමය හෙළිදරව් කිරීම, එකී සමාගම සම්බන්ධයෙන් නිකුත් කරන ලද අධිකරණ නියෝගයකට අනුව අත්හිටුවා ඇත.

දැනුම් දිය හැකි ආකාරය

අධ්‍යක්ෂ, මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ 01

fcrd@cbsl.lk

0112477744

0765780000

HOTLINE 1935

ස්තූතියි !